# එයාර්ටෙල් නවතම 'ඩේටා ඩබල්' 'අවාසි ඩබල්' පැකේජය හඳුන්වා දෙයි

- 'My Airtel' App හරහා කෙරෙන සෑම රුපියල් 99 රිචාර්ජ් කිරීමක් සඳහා 100%ක් අමතර ඩේටා

ශ්‍රී ලංකා තාරුණ්‍යයේ වඩාත් ජනප්‍රියතම ජංගම විදුලි සංදේශ සේවා සැපයුම්කරුවා වන එයාර්ටෙල් ලංකා සමාගමෙහි නවතම 'ඩේටා ඩබල්' 'අවාසි ඩබල්' පැකේජය මගින් දෙගුණයක ඩේටා (double data) ප්‍රතිලාභ ලබා දෙන බව නිවේදනය කර ඇත. 'My Airtel' App හරහා රුපියල් 99 රිචාර්ජ් කර 100% අමතර ඩේටා ලබා දීමෙන් පාරිභෝගිකයින්ට උපරිම වටිනාකමක් ලබා දීම මෙම නවතම දීමනාවේ අරමුණයි.

අද වෙළෙඳපෙළේ ඇති සම්මත කතා කාලය ඉලක්ක කර ගත් පැකේජයන්ගෙන් ඔබ්බට ගිය වටිනාකමක් ලබා දීම සඳහා නිර්මාණය කර ඇති 'ඩේටා ඩබල්' 'අවාසි ඩබල්' භාවිතා කරමින් පාරිභෝගිකයින්ට දැන් සම්බන්ධතාවය පවත්වා ගෙන යා හැකිය. හැකි තරම් ශ්‍රී ලාංකිකයින්ට වඩාත් දැරිය හැකි සහ සම්පූර්ණ ස්මාර්ට්ෆෝන් අත්දැකීමක් ලබා දී එයාර්ටෙල්හි පුළුල් මෙහෙවරට සහය දීම සඳහා මෙම නව පැකේජය සකස් කර ඇත.

කතා කරන වේලාවට සමාන වටිනාකමක් ලබා දීමේ වාසිය සමඟින්, කෙටි පණිවිඩ 1000ක් හා 350 MB ඩේටා ඇතුළුව දවස් 21ක වලංගු කාලයකට යටත්ව රුපියල් 99 පැකේජය මුලින් හඳුන්වා දෙන ලදී. 'ඩේටා ඩබල්' 'අවාසි ඩබල්' දීමනාව හඳුන්වා දීමත් සමඟ 'My Airtel' App තුළින් මිලදී ගැනීම හරහා එයාර්ටෙල් පාරිභෝගිකයින්ට දැන් අමතර 350 MB සමඟින් 700 MB ඩේටා ප්‍රමාණයක වාසියක් හිමි වේ. පාරිභෝගිකයින්ට සිය ජංගම පසුම්බිය, හර හෝ ක්‍රෙඩිට් කාඩ් භාවිතා කර මෙම පැකේජය මිලදී ගත හැකිය.

''ශ්‍රී ලංකාවේ තරුණ්‍ය හා තදින් බැඳුනු සන්නාමයක් ලෙස අපි නිතරම අලුත් ක්‍රම සොයමින් ඉන්නවා මෙවැනි තරුණ පිරිස්වලට ඔවුන්ගේ අභිරුචිය පරිදි සේවාවන් ලබා දීමට, විශේෂයෙන්ම voice සේවාවන්වලට වඩා ඉතා ඉහළ ඉල්ලුමක් ඇති ඩේටා හා කෙටි පණිවිඩ වැනි සේවාවන් සම්බන්ධයෙන්. ඩේටා සේවාවන් සඳහා එයාර්ටෙල් 'ඩේටා ඩබල්' 'අවාසි ඩබල්' වැනි පැකේජ විශේෂයෙන්ම නිර්මාණය කර ඇත්තේ පාරිභෝගිකයන්ගේ මෙවැනි වෙනස්වන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදිය. 'ඩේටා ඩබල්' 'අවාසි ඩබල්' සමඟ 'My Airtel' App හරහා පරිශීලකයින්ට voice සේවාවන්වලට වඩා ඩේටා හා කෙටි පණිවිඩ සේවාවවන් වලට පහසුවෙන් ළඟාවීමේ හැකියාව ද තිබෙනවා.'' යනුවෙන් එයාර්ටෙල් හි ප්‍රධාන විකුණුම් නිළධාරී චන්ද්‍රසේකර් සිංග් චෞහාන් මහතා පැවසුවේය.

නවතම 'ඩේටා ඩබල්' 'අවාසි ඩබල්' පැකේජයත් සමගම **'Airtel 99 Tik Tok Challenge'** නමින් තවත් තරගයක්ද පාරිභෝගිකයින් සඳහා එයාර්ටෙල් සමාගම ආරම්භ කර ඇත. මෙම වැඩසටහනට ඇතුලත් විය හැක්කේ ප්‍රවර්ධනයේ සඳහන් නාද රටාව භාවිතා කරමින් #airteldoubledata සමඟ පාරිභොගිකයින්ගේ නිර්මාණාත්මක වීඩියෝවක් සිය Tik Tok ගිණුම මත upload කිරීමෙනි. මෙම නාද රටාව Tik Tok සමාජජාල පිටුවෙහි **'Airtel 99 Tik Tok'** ලෙස යොදා සෙවුම් කළ හැකිය. මෙම තරගයේ ජයග්‍රාහකයාට ස්මාර්ට් ජංගම දුරකතනයක් ද අනුශූරතාව හා තෙවන ස්ථානය

සඳහා වවුචර පත් ද හිමි වනු ඇත. මෙම **'Airtel 99 Tik Tok Challenge'** තරගය 2020 මාර්තු 15 දින අවසන් වෙයි.

'My Airtel' App නොමිලේ පාරිභෝගික සේවා ලබා දෙන යෙදවුමක් වන අතර ශ්‍රී ලංකාවේ සෑම එයාර්ටෙල් පාරිභෝගිකයෙකුටම එහි ප්‍රතිලාභ අත්විඳිය හැක. 'My Airtel' App භාවිතා කරමින් පාරිභෝගිකයින්ට ඔවුන්ගේ ගිණුම් වෙත පිවිසිය හැකි අතර, දත්ත භාවිතාව හා පරීක්ෂාව, රීචාර්ජ් කිරීම, බිල් ගෙවීම සහ සංගීතය හා චිත්‍රපටි රසවිඳීම ඇතුළු තවත් විනෝදාත්මක අංග රැසකට අවස්ථාව ලැබී තිබේ.

පාරිභෝගිකයාට උපරිම ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරන එයාර්ටෙල් සමාගම සිය පාරිභෝගිකයින්ට ගාස්තු අයකිරීමකින් තොරව 4G සිම්කාඩ්පතකට තම සිම්පත පරිවර්තනය කරගැනීමේ හැකියාව ලබා දී තිබෙන අතර, ඒ සඳහා 5GB ඩේටා නොමිලේ හිමිවීමද විශේෂත්වයකි. 780 හෝ *780# අමතා හෝ සිම්පත් මාරු කරන ආසන්නතම අලෙවි ප්‍රදර්ශනාගාරය වෙත පැමිණ මෙම දීමනා ලබාගැනීමේ ආරම්භය සනිටුහන් කරන්නට එයාර්ටෙල් පාරිභෝගිකයින්ට අවස්ථාව ලබා දී ඇත.

**භාරතී එයාර්ටෙල් ලංකා සමාගම**

2009 ජනවාරි 12 වැනි දින ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කළ එයාර්ටෙල්, ග්‍රාහකයින් මිලියන 01 ඉතාමත්ම ඉක්මනින් සම්පූර්ණ කළ ජංගම සන්නිවේදන සේවා සමාගමයි. වර්ෂ තුනක් වැනි කාලසීමාවක් තුළ සිය ශ්‍රේණිගතවීම ඉහළ නංවාගත් එයාර්ටෙල් සමාගම රට පුරාම සිය ආවරණය පුළුල් කරගනිමින් ශ්‍රී ලංකාවේ වේගවත්ම ජංගම සන්නිවේදන සේවා ජාලය බවට පත්විය. වර්තමානයේදී එයාර්ටෙල් සමාගම උසස් තත්ත්වයේ සහ සාධාරණ මිල ගණන් යටතේ හඬ සහ දත්ත සේවාවන් ලබා දෙන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ලියාපදිංචි වෙමින් මෙරට වඩාත් වේගවත් හා පුළුල් ආවරණයක් හිමි ජංගම විදුලි සංදේශ සේවා සමාගමක් බවට පත්ව තිබේ. වැඩි විස්තර සඳහා www.airtel.lk වෙත පිවිසෙන්න.